19/09/2010 - ඉරිදා ලංකාදීප

## ශ්‍රී ලාංකිකයන්ට විශ්වාසය දිනාගත හැකි සාධාරණ සමාජයක් ගොඩනගමු - මිලින්ද මොරගොඩ

ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරන්නට පටන් ගත්තේ 1931 තරම් ඈත කාලසීමාවක දීය. එයට කලින් ලංකාව අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිතයකි. බටහිර විසින් ලංකාව යටත් කරගන්නා අවස්ථාවේ අධිරාජ්‍යවාදීන් වඩා ප්‍රයෝජනයට ගත්තේ රට තුළ එවකට පැවති බෙදීම්ය. තව තවත් බෙදීම් ඇති කර සමාජය තුළ පැවති එකමුතුබව තුරන් කළ අධිරාජ්‍යවාදීහු එය ස්වකීය පාලනය පවත්වාගෙන යාමට පාවිච්චි කරන අතර ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණ මෙරට සමාජයට කාවැද්දූහ. යටත්ව සිටි අවුරුදු පන්සියයක කාලය තුළ විවිධ ආගම්, භාෂා, සිරිත් විරිත් හා ආකල්ප ලාංකික සමාජයට ඇතුල් වූ අතර නිදහස ලැබීමෙන් අනතුරුව ගතවූ කාලය ඇතුලත වුවද රටට මේ සියලු දේ අත්හැර කලින් පැවති ලාංකික අනන්‍යතාවය කරා ආපසු ගමන් කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි දෙයක් විය. එය එසේ විය යුතු ද නැත. අවුරුදු පන්සියයක අතීතය අමතක කළත් එයින් එපිට දී ද ලාංකිකත්වය විවිධ ජාති හා සංස්කෘතික ආක්‍රමණවලට ලක්ව තිබේ. අවුරුදු දහසක් ආපසු ගිය ද සැබෑ අනන්‍යතාවය කුමක් ද යන්න අනාවරණය කර ගැනීම දුෂ්කරය.

ශ්‍රී ලංකාව දූපතක් හෙයින් එහි පැවැත්ම සිදුවූයේ බාහිර සම්බන්ධතා සමගය. ඉතිහාසය දෙස බලමින් මේ සියලු එකතුවීම් වලට ගැරහීම හෝ ඒවා ප්‍රතික්ෂේප කරනවාට වඩා අනාගතය සකස් කර ගැනීම ගැන රටක් වශයෙන් අවධානය යොමු කිරීම වැදගත්ය. රට තුළ ඇති විවිධත්වය හා එකිනෙකට වෙනස් බව ශක්තියක් කරගෙන ශ්‍රී ලාංකිකත්වය සම්බන්ධ පොදු අනන්‍යතාවයක් ගොඩ නැගීම අවශ්‍යය. අතීතය පාඩමක් කරගෙන අනාගතය ගැන සැලකිල්ලක් ක්‍රිවීම විනා අතීතයට දොස් පවරමින් හා විවේචනය කරමින් කාලය ගත කිරීම එහිලා වැදගත්ය. අතීතය, එහි ආක්‍රමණ, පාවාදීම් හෝ චෝදනා වෙනුවට අනාගත පරපුර වෙනුවෙන් යහපත් රටක් ගොඩ නැගීම වර්තමානයේ කාර්ය භාරය විය යුතුය.

රටට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය ලැබුණත් එහි ඇති සාධනීය ලක්ෂණ සමාජ දේහයට එකතු වී නැත. අධිරාජ්‍යවාදය එදා අපේක්ෂා කළ පරිදි තවමත් රට තුළ බෙදීම් ඇති කරනවා විනා රට එකමුතු කරන්නට පවතින පක්ෂ දේශපාලනයෙන් වැඩි මෙහෙයක් ලැබෙන්නේ නැත. විවිධ මත ඇතිවී, එම මත තුළින් වඩාත්ම යහපත් අදහස්වලට ඉඩ ලැබී එයින් සමාජය එකතු කරන ක්‍රිකම ප්‍රජාතන්ත්‍රවාදයේ හරය ලෙස රටට බද්ධ නොවූයේ මන්ද? ව්‍යාපාරික, දේශපාලන ඇතුලු අංශ වලට පන්ති ප්‍රශ්නයක් තිබේ. නිදහස ලැබීම සමග අධිරාජ්‍යවාදීන් ඇති කළ මෙම පංති පැවැත්මෙන් සම්පූර්ණයෙන්ම ඈත්වන්නට අපේ රටට හැකියාව ලැබී නැත. පෙලැන්තියට පිටින් ඉදිරියට එන ව්‍යාපාරිකයන්ට මෙන්ම දේශපාලන නායකයන්ට ද විවිධ බාධාවලට මුහුණ දෙන්නට සිදුවෙයි. ඔවුන්ට එකී පන්ති බාධා වලට එරෙහිව ක්‍රියා කරන්නට යාම නිසා අරමුණෙන් යම් ප්‍රමාණයකට බැහැරවන්නට සිදුවන නිසා අවධානය බිඳ වැටෙන අතර එය හානියකි. පෙලැන්තියට පිටින් බිහිවන ව්‍යාපාරික හා දේශපාලන නායකත්වයන්ට අවස්ථාව දෙන සමාජයක් අපට බිහි කළ හැකි නම් මෙතරම් ප්‍රශ්න ඇතිවන්නේ නැත. එපමණක් නොවේ. එකම පවුලේ සහෝදරයන් පවා බෙදා වෙන්කරන දේශපාලන ක්‍රමයක් මගින් සමාජ ප්‍රශ්න විසඳිය නොහැකිය. වර්තමානයේ එකම පවුලේ අය එකිනෙකට වෙනස් දේශපාලන පක්ෂ වලට සම්බන්ධව ක්‍රියාකරන අයුරු පෙනේ. අධිරාජ්‍යවාදීන් ගේ පාලනයේදී සිදුවූ මෙවැනි දේ තමන්ට වාසි හෝ අවාසි ලෙස එකිනෙකට වෙනස් ව දකින්නට එයට ගොදුරු වූ රටවල් සමත්ව සිටී. සිංගප්පූරුව කියන්නේ එයින් තම පරිවර්තන යුගයකට අවස්ථාව ඇති කර ගත් බවයි. ඇතැම් ආසියානු හා අප්‍රිකානු රටවල් ඒ ගැන චෝදනා කරමින් සිටියේය. එනමුත් අප්‍රිකානු රටවල් අද ඉදිරියට පැමිණෙමින් තිබේ. අන්ධකාර මහද්වීපය පැවති අධිරාජ්‍යවාදී බැඳීම් වලින් මිදී දියුනුව කරා පා තබන බව පෙනේ.

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය අනුව අපට අපේ අනාගතය ගැන තීන්දු ගැනීමට අයිතිය තිබේ. එසේ නමුත් ගතවූ කාලය ඇතුලත අප ගමන් කර ඇත්තේ නිවැරදි මාවතේ ද? එසේ ගමන් කළානම් රටට මෙතරම් ප්‍රශ්න ඇති වන්නේ නැත. එහි වැරැද්ද ඇත්තේ ලෝකයේ රටවල් වැඩිම ගණනක විවිධ අන්දමට ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදයේ ද? නොඑසේනම් එය භාවිතාවට ගන්නා ලාංකික සමාජය අනුවද? ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ අන්තවාදය බිහිවන්නට ඉඩ තිබේ. එය සීමිත කාලයකටය.

එල්.ටී.ටී.ඊ සංවිධානය අන්තවාදී උගුලක් අප රටේ ඇති කළේය. අන්තවාදයට රට ගමන් කරන අවස්ථාවක බිහිවන්නේ ප්‍රභාකරන් වැනි වීරයන්ය. රටක යහපත් පැවැත්ම ඇතිවන්නේ මැද මාවතේ දේශපාලනයෙන් පමණකි.

වර්තමානයේ අන්තවාදයට ගමන්කරමින් අප සමාජය හැසිරෙන අන්දම ගැන කතාකරන විට අද පවතින ස්වභාවය ගැන මෙවැනිම අවස්ථාවකදී ඇමරිකාවේ හිටපු ජනාධිපතිවරයෙකු වූ ජෝන් ඇඩම්ස් කළ සුවිශේෂී සඳහනක් සිහිපත් කිරීම වටී.

"We please ourselves with the prospect of free and popular governments but there is great danger that those governments will not make us happy. But I fear that in every assembly members will obtain an influence by noise not sense, by meanness not greatness, by ignorance not learning, by contracted hearts not large souls. There is one way, my dear sir, that must be attempted and most sacredly observed or we are all undone. There must be decency and respect and veneration introduced for persons of authority of every rank or we are all undone."

එහි සරල පරිවර්තනයක් දැක්වුවහොත් මෙසේය.

''ජනප්‍රිය හා ශක්තිමත් ආණ්ඩුවක් ලෙස තමන් ගැනම අප ගැනම සිතන නමුත් අප සතුටට පත් නොකරන විශාල අවදානමක් ඇත. පාර්ලිමේන්තුවේ සෑම සාමාජිකයෙකුම සිය බලය ලබාගන්නේ බුද්ධිමත් බවින් නොව ඝෝෂාවෙනි. පහත් දේ මගින් මිස විශිෂ්ට දෙයින් නොවේ. නොඋගත් බවින් මිස උගත් බවින් නොවේ. පුළුල් බවක් නැති එවැනි හදවත් විසින් විශාල ආධ්‍යාත්මයක් බිහි කරන්නේ නැත. අප උත්සාහ කළ යුතු එහෙත් මෙතෙක් නොකරන ලද එක් දෙයක් ඇත. සියලු තලයන්හි බලය ඇති අප සියලු දෙනාටම ගරුත්වය හා පූජණීයත්වය සම්බන්ධයෙන් පූර්ණ අවබෝධයක් තිබිය යුතුය. එසේ නොවුනහොත් අප සියලු දෙනාම පිරිහේ.''

නිදහස් ලංකාවේ පළමු අග්‍රාමාත්‍ය මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මහතාගේ පටන් ශ්‍රී ලංකාවේ කිසිදු දේශපාලන නායකයෙකු හෝ නායිකාවක රට විනාශ කරන තීන්දු ගත්තේ නැත. තමන්ගේ රට බංකොලොත් කර ලංකාව අරාජික කරන්නට තීරණය කරන්නේත් නැත. රට මෙහෙයවූ සියලු නායකයන් මෙතෙක් උත්සාහ කළේ රට ගොඩනගන්නටය. රටට හා මහජනතාවට ඇති ප්‍රශ්න වලට සාධාරණ විසඳුම් ඇතිකර යහපත් සමාජයක් ගොඩනගන්නටය. එකී අරමුණ ඇතිව ක්‍රියාකිරීමේ දී අප වරද්දා ගත්තේ පක්ෂ දේශපාලනයට ජාතිවාදය ඇතුල් කිරීමෙන් බව පැහැදිලිය. පක්ෂ හා ජාතීන් එකමුතු කරන වැඩපිළිවෙලක් වෙනුවෙන් හැම අවස්ථාවකදීම පැවති ඉඩ සීමිතය. ක්‍රමයෙන් සිංහල හා දෙමල සමාජය දේශපාලන පක්ෂ අනුව දෙපැත්තට වෙන්වූ අතර එය සමාජය එකමුතුකර ලාංකිකත්වය ගොඩනගන දර්ශනය යටපත් කරන්නක් විය. මෙම දේශපාලන පක්ෂ අධිරාජ්‍යවාදීන්ගෙන් රටට ලැබුණ එකකි. අද එය කැපුවත් නිල් හා කැපුවත් කොළ වශයෙන් තවත් ගෝත්‍ර ක්‍රමයක් දක්වා වර්ධනය වී ඇත. දර්ශනයකට නොව තමන්ගේ ගෝත්‍රය නිසා පක්ෂ වලට ලැදි සමාජයකින් සමාජයට අලෝකයක් ලැබී නැත. එය අද පන්ති, කුළ ගෝත්‍ර වැනි දේශපාලන ගෝත්‍ර සමාජයක් රට තුළ බිහි කර තිබේ.

සිංහල සමාජය හා දෙමල සමාජය අතර ක්‍රමයෙන් වර්ධනය වූ සමාජ බෙදීම් 70 දශකය පමණ වන විට වඩා පුළුල් වූ අතර, ඒ නිසා විවිධ කොටස් තම පසුබිම, සංස්කෘතිය හා භාෂාව අනුව එකිනෙකට වෙනස් ආකාරයට තමන්ට සලකන බව සිතන්නට පටන්ගෙන තිබුණි. ගැටුම් සහිත කාල පරිච්ඡේදය වන විට මුස්ලිම් සමාජයට ද එසේ සිතන්නට පොළඹවන පසුබිමක් ඇති විය. එපමණක් නොවේ. ආගමික අන්තවාදයක් ද බිහිව ස්වකීය අනන්‍යතා අනුව වෙන් වෙන්ව ක්‍රියාකරන්නට උත්සාහ කළේය. එය භයානක තත්ත්වයක් වූ අතර නොසන්සුන්බව හා අතෘප්තිය ඇති කරන්නකි. උතුරේ, දකුණේ මෙන්ම නැගෙනහිර ද මතුවූ තමන්ට අසාධාරණයක් සිදුවන බවට විශ්වාස කරන හැඟීම දුරුකරන්නට දේශපාලනය විසින් නිසි අවස්ථාවේ නිසි පියවර ගත්තේ නැත. ඇතැම් විට දේශපාලනඥයන් විසින් උපායශීලී ලෙස බෙදීම් ඇති කර බලයට පත්වන්නටත් ක්‍රමය ආරක්ෂා කරගන්නටත් උත්සාහ කළ බව පෙනේ.

තම ප්‍රශ්න සාධාරණ හා යුක්ති සහගත ලෙස නොවිසදෙන බව හැඟෙන ඕනෑම සමාජයක් තුළින් ප්‍රජාතන්ත්‍රවාදී නායකයන් වෙනුවට විකල්ප බලවේග මතුවෙන්නට පටන්ගනී. ශ්‍රී ලංකාවේ ද එය එසේ ම අවස්ථා ගණනාවක සිදුවිය. එම බලවේග මතුවූයේ ඇයි ද යන්න සොයාබලන්නට අප උනන්දු වූයේ නැත. දකුණේ තරුණ අරගලය මැඩපැවැත්වූ ආණ්ඩුව තරුණ අසහන කොමිසමක් මගින් එහි හරය යම් තරමකින් අනාවරණය කර ගත් නමුත් අද එම කොමිසමේ නිර්දේශ අතුරින් ක්‍රියාවට නැගී ඇති යමක් නැති තරම්ය. මෙවැනි බලවේග ප්‍රජාතන්ත්‍රවාදයට ඇති අභියෝගයක් වශයෙන් තේරුම්ගත් පාලකයන් උතුරේ හා දකුණේ වෙනසක් නැතිව එයට දුන් එකම විසඳුම මර්දනයයි. සමාජය එකමුතු නොකළ අතර, සාධාරණ ප්‍රශ්න ගැන යුක්ති සහගත පිළිතුරු සපයන්නට අපොහොසත් වන විට, එකිනෙක අභිබවමින් බලවේග මතුවන්නට පටන්ගත්තේය. මෑතක දී අභ්‍යන්තර  යුද්ධයකට පසු මැඩ පවත්වන්නට සිදුවූ එල්.ටී.ටී.ඊ සංවිධානය එහි එක්තරා තීරණාත්මක සංධිස්ථානයකි.

අහිංසක පුද්ගලයන් ම්ලේච්ඡ ලෙස ඝාතනය කරමින් හා සිය දිවි නසා ගනිමින් ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් වල නිරත එල්.ටී.ටී.ඊ වැනි නපුරු සංවිධානයක් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට විශාල තර්ජනයක් වූ අතර, එය මැඩපැවැත්වීම අවශ්‍යය. එසේ නමුත් මර්දනයෙන් පමණක් එවැනි සංවිධාන බිහිවන හේතු සහමුලින්ම තුරන් වී යා නොහැකිය. එය අප අවබෝධ කර ගත යුතු ප්‍රමුඛ කාරණයයි. යථාර්ථය හඳුනාගෙන  හේතු වලට විසඳුම් නොදීමෙන් ඉදිරියේ දී මෙයට වඩා දරුණු ත්‍රස්තවාදයකට පසුබිම සැකසීමට ඉඩ ඇති බව අමතක කළ යුතු නැත. මූලික ප්‍රශ්න ගැඹුරින් අධ්‍යයනය කළ ඒ වාට නිසි විසඳුම් ලබා දිය යුතුය. සිද්ධිය විචාරා එහි යථාර්ථය හඳුනාගෙන, එයින් පාඩමක් ඉගෙන ගන්නට සමාජයත්, සමාජ නායකයනුත්, විශාල උනන්දුවක් ව්‍රික්විය යුත්තේ එහෙයිනි. එයට මග පාදා ගැනීමේ දී ''නහී වේරේන වේරානී '' යන බුදු වදන අනුව යා යුතුය. ත්‍රස්තවාදීන් යනු සමස්ථ දෙමළ ජාතිකයන් නොවේ. ඔවුන් දිනාගත හැකි අන්දමට ආකල්ප වෙනසකට යා යුතුය. බරපතල විනාශයක් කළ හා මහජනතාව වෛර කළ ත්‍රස්තවාදී සංවිධානයක උපත සමාජයයි. ත්‍රස්තවාදය මත්ස්‍යයෙකු නම්, සමාජය එම මත්ස්‍යයා ජීවත්වන ජලය බවත්, ජලය ඉවත් කිරීමෙන් විනා මතස්‍යයා අල්ලා ගත නොහැකි බව ආරක්ෂක අංශ අතර ඇති ප්‍රකට අදහසකි. මහජනතාවගේ හිත දිනා ගත යුත්තේ රජයයි. එය ක්‍රමානුකූලව හා ප්‍රජාතන්ත්‍රවාදී අන්දමට නොවෙන අවස්ථාවේ දී ත්‍රස්තවාදය වටා ජනතාව එකතුවෙයි. මෙම වගකීම දේශපාලනයට පමණක් පැවරිය නොහැකිය. සිවිල් සමාජයේ නායකයින් ඇතුලු අප හැම දෙනාගේ ම වගකීමකි. ඔවුන් සිය අදහස් හා මත ඉදිරිපත් කළ යුතුය. මධ්‍යස්ථ මතධාරීන්ගේ අදහස් මතුවන්නේ එවිටය. සාධාරණ සංවාදයක් මගින් යහපත් අදහස් එවිට ඉස්මතු වෙයි. රටට සමාජයට ගැලපෙන ක්‍රමයක් එයිනි බිහිවෙයි. අප විසින් අපගේ පාලනය වෙනුවෙන් බිහි කරන ක්‍රමය අපට විශ්වාස කළ හැකි හා අපේ දරුවන්ගේ අනාගතය ගොඩනගන එකක් බව දැනෙන විට කැරළි හට ගන්නේ නැත.

මෙය වලක්වා ගත හැකි වන්නේ රට තුළ සමාන අවස්ථා ඇති බෙදීම් වලින් තොර සමාජයක් ගොඩ නැගීමෙනි. ඒ වෙනුවෙන් ශ්‍රී ලාංකික අනන්‍යතාවය ඇති ක්‍රමයක් සම්පාදනය කර ගන්නට අප සමත්ව නැත. ප්‍රජාතන්ත්‍රවාදය ගැන අවධානය යොමු කරන විට යම් ප්‍රමාණයකට ඒකාධිපති පාලන ලක්ෂණ තිබුණ රටවල් ආර්ථික වශයෙන් දියුණු වී තිබේ. එසේ නමුත් ඒකාධිපති පාලන ක්‍රම පැවති සියලුම රටවල් සාර්ථක වී ඇති අවස්ථා නැත. ප්‍රජාතන්ත්‍රවාදය රටක දියුණුවට වැදගත්ද? වැදගත් වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය හෝ එහි ගුණාංග නොවේ. ලෝකයේ නොයෙකුත් රටවල් තමන්ගේ සමාජවලට ගැලපෙන පරිදි ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණ සකස් කරගෙන ඇත. අවසානයේ දී රටට ආඩම්බරවිය හැකි පාලන ක්‍රමයක් කරා අප ගමන් කළ යුතුය. උදාවී තිබෙන, ත්‍රස්තවාදය අවසන්වී සමාජය ගොඩනගන මේ අවස්ථාවේ දී මේවා අවධානයට ලක්කළ යුතු පැතිය.

එල්.ටී.ටී.ඊ සංවිධානය දේශීයව පමණක් නොව ජාත්‍යන්තරව ද තමන්ට අවශ්‍ය ශක්තිය හා බලය ලබාගන්නට උපායශීලීව සමත්විය. ක්‍රමයෙන් උත්සන්න වන ත්‍රස්තවාදය විසඳාගැනීමට දේශපාලනඥයන් එකමුතු නොවන අතර පක්ෂ කඹ ඇදීමේ වාසිය අත්පත් කර ගත්තේ එල්.ටී.ටී.ඊ සංවිධානයයි. සුළු ජාතිකයන්ට තමන්ගේ සාධාරණ ගැටලුවලට විසඳුමක් දෙන්නට දකුණේ නායකයන් උනන්දු නැති බව පෙන්වන්නට ඔවුන්ට එය කදිම පසුබිමක් සැකසීය. එපමණක් නොවේ. දකුණේ දේශපාලනයේ මර්මස්ථාන නිර්මාණය කරන තරමට ද එල්.ටී.ටී.ඊ සංවිධානය ශක්තිමත්විය. ආපසු හැරී බලන විට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු බලයෙන් පහ කරන්නට හා තමන්ට අවශ්‍ය නායකයන් බලයට

පත්කිරීම දක්වා එල්.ටී.ටී.ඊ සංවිධානය ස්වකීය න්‍යාය පත්‍රයට අවශ්‍ය ලෙස කටයුතු කර තිබේ. රටේ පක්ෂ නායකයින්, මරා දමමින් අනාගතයේ ප්‍රබල නායකත්ව ඇති නොවන අන්දමට පරම්පරාවක් විනාශ කළේය. එය ශ්‍රී ලංකාවේ දේශපාලනය පමණක් නොව රජීව් ගාන්ධි වැනි නායකයින් ඝාතනය කරමින් ඉන්දියාවේ දේශපාලනය දක්වා පරාසයකට එය විහිදීමට තරම් ශක්තිමත් විය.

ආණ්ඩු ගණනාවක් එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය ට මුහුණ දීමට විවිධ අන්දමට ක්‍රියාකර තිබේ. ජේ. ආර්. ජයවර්ධන මහතා සාකච්ඡා වාරගණනාවක් පැවැත්වීය. තිම්පු සාකච්ඡා හා සර්ව පාක්ෂික සමුලු සාකච්ඡා ඒ අතර කැපීපෙනෙයි. ඒ සාකච්ඡා අසාර්ථකවීම සමග ආයුධ ගත් ත්‍රස්තවාදීන් මර්දනය සඳහා යුදමය මාවතට අවතීර්ණ වන්නට රජයට සිදුවිය. එහිදී ඉන්දීය මැදිහත්වීමද විශේෂිත එකකි. එල්.ටී.ටී.ඊ සංවිධානය ජාත්‍යන්තරව පැතිරීම හා තමන් සාධාරණ වර්ගවාදී අරගලයක නිතරවනබව පෙන්වීම නිසා ජගත් ප්‍රජාවගේ අවධානය හා සහාය ලබාගන්නට සමත්ව තිබිණ. ජගත් ප්‍රජාව ඊලාම් රටක් පිහිටුවන්නට උදව් කළේ නැත. එසේ නමුත් රට තුළ සුලු ජාතිකයන්ට යම් අසාධාරණයක් වෙමින් පවතින් බව ඔවුහු විශ්වාස කළේය. එසේ සිතන්නට අසූ තුනේ ජුලි අරගලය මහා අවස්ථාවක් විය. සිංහල අන්තවාදීන් සුළුතර ද්‍රවිඩ ජාතිකයන් විනාශ කරන අතර තමන් ගෙනයන්නේ විමුක්තිය උදෙසා අරගලයක් බව දක්ෂලෙස ලෝක ප්‍රජාවට පෙන්වන්නට එමගින් එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය මග පාදා ගත්තේය. රටින් පිට ගිය දෙමල ජාතිකයන්ගේ දෙවන පරම්පරාව ජාත්‍යන්තර සමාජයේ දේශපාලන හා සිවිල් සංවිධානවල ප්‍රධාන චරිත වලට සමීපවෙමින් ශ්‍රී ලංකාව ගැන අහිතකර අදහස් ප්‍රචාරය කළේය. තම දෙමාපියන්ට සිදුවූ කණගාටුදායක සිදුවීමවිනා ශ්‍රී ලංකාවේ ඇත්ත එය නොවනබව ඔවුන් නොප්‍රින සිටියේය.

ඉන්දියාවේ දේශපාලන පසුබිම හා එමගින් උද්ගතවන කාර්ය භාරය ගැන යථාර්ථවාදී අවබෝධයක් ඇති කර ගැනීමට අසමත්වීමේ ප්‍රතිපලයක් වශයෙන් ඉන්දීය හමුදාව පැමිණීම හා එරට ප්‍රාන්ත රාජ්‍ය බලය බෙදන ආකාරය යෝජනා කරමින් දහතුන් වැනි ව්‍යවස්ථා සංශෝධනය අදහස් ඉදිරිපත් විය. රාජ්‍යතාන්ත්‍රික වශයෙන් ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර බැඳීම් උච්ච අවස්ථාවකට ගෙන යන්නට අප අපොහොසත් වූ අතර එහි අවස්ථාව දිනා ගත්තේ රට තුළ ක්‍රියාත්මක ත්‍රස්තවාදී සංවිධානයක් වීම විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුය. තමිල්නාඩු ප්‍රාන්ත දේශපාලනයෙන් ඉන්දීය මහ ආණ්ඩුවට ඇති බලපෑම තේරුම්ගෙන ඉන්දියන් විරෝධයකට නොගියේ නම් මෙම ගැටලුවට මෙයට වඩා වෙනස් විසඳුමක් තිබෙන්නට ඉඩ තිබුණි.

එල්.ටී.ටී.ඊ සංවිධානය ඉන්දියන් හමුදාව ඉදිරියේ පරාජය වෙමින් සිටි අවස්ථාවේ උපායශීලී ලෙස ඉන්දියන් හමුදාව ඉවත් කර ගැනීමට දකුණේ ජනමතය අවුලවන්නට ක්‍රියා කළේය. ජනාධිපතිවරණයේ දී ප්‍රධාන අපේක්ෂකයන් වූ ආර්. ප්‍රේමදාස මහතා හා සිරිමාවෝ බණ්ඩාරණායක මහත්මිය ඉන්දීය හමුදාව රටින් පිටකිරීම ස්වකීය මැතිවරණ වේදිකාවේ ප්‍රධාන මාතෘකාව බවට පත් කර ගත්තේය. ඒ අවස්ථාවේ දී ද එල්.ටී.ටී.ඊ සංවිධානය සිය න්‍යාය පත්‍රය විසුරවන ලද්දේ දකුණේ ජනප්‍රිය මතය හා ඒ තුළ පැවති බෙදීම් සූක්ෂම අයුරින් උපයෝගී කර ගනිමින් බව ෆ්‍රින් පැහැදිලිය. උතුරේ ප්‍රශ්නය වෙනුවෙන් දකුණේ සමගියක් නැති බව එල්.ටී.ටී.ඊ සංවිධානය අවබෝධ කරගෙන සිටියේය. එක අදහසකින් රට එකතු වූවා නම් එය ඔවුන්ට අවාසි සහගත බැවින් නිතරම දකුණේ බෙදීම් ඇති කරන්නට විවිධ උපාය පාවිච්චි කළේය.

ජේ. ආර්. ජයවර්ධන මහතා නතර කළ තැනින් ප්‍රේමදාස මහතා සාකච්ඡා ආරම්භ කළේය. දකුණේ රාජ්‍ය නායකත්වය වෙනස් වී ඔවුන්ගේ ආකල්ප හා හැසිරෙන ආකාරය වෙනස් වූ නමුත් ප්‍රභාකරන්ගේ ආකල්පය හා අරමුණු වෙනස් වූයේ නැත. ඔහු නිතරම ක්‍රියා කළේ මෙය ත්‍රස්තවාදයක් නොව ජාතිවාදී අරගලයක් බවට පෙරලන්නටය. දෙමල ජාතිකයන් යනු ත්‍රස්තවාදීන් නොවේ. ඔවුන් සුලු ජාතිය වශයෙන් කොන් වෙන බවක් සිත තුළ ජනිත වන විට සාධාරණව ක්‍රියා කරන ආණ්ඩුවකින් වුවත් තමන්ට වෙනස්කම් සිදුවෙන බව සිතන්නට පටන් ගනී. ක්‍රමයෙන් පීඩාව දරා ගන්නට අසමත්වන මොහොතේ ආයුධ අතට ගෙන ත්‍රස්තවාදීන් වන්නේ මේ පුද්ගලයන්ය. ජනාධිපතිවරණයෙන් ප්‍රේමදාස මහතා ජයගත් පසු ඉන්දීය හමුදාව රටින් පිටත්ව ගිය නමුත් ස්වාධීන ඊලාම් රාජ්‍යයක් ගොඩනගන අරමුණට ජාත්‍යන්තර සහාය ලැබීම එයින් සීමාවූයේ නැත. ඒ වන විට රටින් පැන ගොස් සිටි ලක්ෂ සංඛ්‍යාත දෙමළ ලාංකිකයන් මෙම එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයට උදව් කරන විශාල බලවේගයක් බවට පත්ව තිබුණි. තාක්ෂණය දියුණු හා තොරතුරු හුවමාරුව මගින් වේගවත්

වෙමින් තිබුණ ලෝකය ශ්‍රී ලංකාවේ සිංහල හා දෙමළ ප්‍රජාව අතර සටනක් පවතින බව ඉතා ඉක්මනින් පතුරුවා හැරියේය. රටතුළ ඇති කරන ලද ම්ලේච්ඡ ක්‍රියා මගින් සිංහල අන්තවාදය අවුලවන්නට එල්.ටී.ටී.ඊ සංවිධානය ක්‍රියා කළ අතර දෙමල ජාතිකයන් වෙනම සංවිධානය වෙමින්, ත්‍රස්තවාදයක් නොව සිය විමුක්තිය උදෙසා දෙමල ජාතිකයන්ට වෙන්වූ ඊලාම් රාජ්‍යයක් ගොඩනැගීම එකම අරමුණ සේ සලකා හැසිරෙන අවස්ථාවට එළැඹ සිටියේය. දකුණේ නායකයන් අමානුෂික ලෙස ඝාතනය විය. සිංහල දෙමල ජාතිවාදී අරගලයක් නොව, මහජනතාවගේ ප්‍රශ්න විසඳා ගැනීමේ දේශපාලන උවමනාවක් බව පෙන්වන්නට සාධාරණ ලෙස උත්සාහ කළ අවංක දෙමළ නායකයන් ද එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයට ගොදුරු විය. ලාංකික සමාජයේ ජාතීන් අතර තිබූ බැඳීම් විනාශ වෙන්නට පටන් ගත්තේය. එහි ප්‍රතිවිපාකය තවත් දරුණු වූ අතර ජාතීන් දෙක අතර සුහදත්වයට හානිකර විය. එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය අපේක්ෂා කළේ එයයි.

ජනාධිපති ආර්. ප්‍රේමදාස මහත්මා ඝාතනයට ලක්වූ අතර විජේතුංග මහතා අන්තර්කාල පරිච්ඡේදය තුළ විශාල ප්‍රයත්නයකට නොගියේය. එනමුත් නැගෙනහිර පලාත ත්‍රස්තවාදයෙන් මුදවා ගැනීමේ මෙහෙයුම් ඇරඹී තිබිණ. අනතුරුව බලයට පත් ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ද සාමය ඇති කිරීමට ප්‍රයත්නයක් ෆ්‍රිරුවාය. එතුමියට තිබුණ ජනතා කැමැත්ත අනුව යළි සාම සාකච්ඡා අරඹන්නටත්, දකුණේ දේශපාලන පක්ෂ එකතු කර පොදු විසඳුමකට යන්නටත් පමණක් නොව විසඳුමක් වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයටත් උත්සාහ කළ නමුත්, පක්ෂ දේශපාලනය විසින් ඉතිහාසයේ හැසුරුණු ආකාරයටම එකිනෙකට වෙනස් ආකල්ප ඇතිව කටයුතු කිරීම නිසා සිදුවූයේ එකඟතාවයක් නැති හමුවීම් පමණකි. ව්‍යවස්ථා සංශෝධනය ගැන අවධානය යොමු වන විට දකුණේ දේශපාලන පක්ෂ වල තිබුණ එක් පක්ෂයක් අදහසක් ඉදිරිපත් කරන විට අනෙක් පක්ෂය එයට විරුද්ධ වන සුපුරුදු පටු අරමුණු අනුව එයට විරුද්ධ විය. කල් ගතවීම, විසඳුමක් වෙනුවෙන් දකුණේ සිංහල දේශපාලනය එකඟ නොවීම වැනි කාරණා අවසානයේ එල්.ටී.ටී.ඊ සංවිධානයට වාසිදායක අවස්ථා ඇති කළේය.

ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂ දෙක එකතුවීමෙන් දකුණේ පොදු මතයක් ඇතිව එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයට විසඳුමක් සකස් කර ගැනීමේ අහඹු අවස්ථාව උදා වූයේ විධායක බලය චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය හා පාර්ලිමේන්තු ව්‍යවස්ථාදායකයේ බලය රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රධාන එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුවට ලැබීම සමගය. විසඳුමක් ලබා ගැනීමේ අවංක උවමනාවෙන්, විධිමත් රාමුවක් හා න්‍යාය පත්‍රයක් ඇතිව පියවරෙන් පියවර සාම සාකච්ඡා ආරම්භ වුවත්, එම් අවස්ථාවේ දී ද එල්.ටී.ටී.ඊ සංවිධානය ස්වකීය ඊලාම් රාජ්‍යය බිහි කිරීමේ අරමුණෙන් ඉවත් නොවීය. ජාත්‍යන්තර ප්‍රජාව හමුවේ රජයේ ක්‍රියාමාර්ග පෙන්වා ජාත්‍යන්තර ප්‍රජාවගේ පීඩනය එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන්ට එරෙහිව මතුකිරීමට මෙම කාලයේ දී දරන ලද උත්සාහය වඩා වැඩි අවධානය යොමු කළ යුතු එකකි. රජය උණුසුම් හදවත්, සන්සුන් මනසක් හා ගැඹුරු හුස්මක් යන සංකල්පයෙන් සාකච්ඡා මේසයට ගියේය. ත්‍රස්තවාදීන් කෙරෙහි අවංකව සහයෝගයෙන් වැඩ කිරීමට උණුසුම් හදවත් ඇතිව සිටි අතර සන්සුන්ව තියුණු අවධානයකින් ක්‍රියා කළේය. සාම සාකච්ඡා අතර බුද්ධි අංශය ශක්තිමත් කළේය. ඒ හෙයින් මුහුදේ ආරක්ෂාව වැඩි කර ආයුධ නැව් පැමිණීම වලක්වන්නට ගත යුතු හැම පියවරක්ම ගත්තේය. නාවික අංශ ශක්තිමත් කරන්නට බලගතු ආරක්ෂක නැව් මිලදී ගත්තේය. සාම සාකච්ඡා මේසයට එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් පෙළඹවීමේ මැදිහත්කරුවන් වශයෙන් නෝර්වේ රාජ්‍යය ශ්‍රී ලංකාවට සහය විය. මැදපෙරදිග සාම සාකච්ඡා වලට සහභාගී වී අත්ද්‍රැකීම් සහිතව සිටි සහ ජාත්‍යන්තරව විසිරී සිටි දෙමළ ජාතිකයන්ට කතා කරන්නට හැකි රටක් වශයෙන් නෝර්වේ කැපී පෙණින. ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය නොර්වේ රට මැදිහත්කරුවන් වශයෙන් තෝරා ගත්තාය. ඇමරිකාව, යුරෝපීය ප්‍රජාව, නෝර්වේ හා ජපානය සාම ක්‍රියාවලියේ සම සභාපතිවරු වශයෙන් ක්‍රියා කළහ. මේ සමග ත්‍රස්තවාදයෙන් ජීවිත හා දේපොල විනාශවීම වලකාගැනීමේ අරමුණඇතිව සටන් විරාම ගිවිසුමක් අත්සන් කරන ලද අතර එය යථාර්ථවාදීව ඉදිරියට ගමන් කරන ආකාරය ගැන නිරීක්ෂණයට අවි රහිත සාම සාධක මෙහෙයුම් බලකායක් පත්කරනු ලැබීය. ඉන්දීය රජය මෙම සාම සාකච්ඡා හා සාම ක්‍රියාවලියේ වැදගත් සාධකයක් බව තේරුම්ගත් රජය, එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයට එරෙහිව ශ්‍රී ලංකාව ගන්නා පියවර පිලිබඳව නිරතුරුව නවදිල්ලිය දැනුම්වත් කළහ.

මේ නිසා එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයට ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ අවංකව හැසිරෙන්නට සිදුවූ අතර, මෙතෙක්කල් දෙමල ප්‍රජාව විසින් ජාත්‍යන්තරව පතුරවනලද නොයෙකුත් අසත්‍ය හා අපකීර්තිමත් ප්‍රචාරයන් වෙනුවට සමසභාපතිවරුන් මැදහත්කරුවන් හා සාමසාධක බලකාය වැනි අංශ පමණක්නොව ඉන්දියාව ඉදිරියේද ප්‍රතිපත්තියක් ඇතිව හැසිරෙන්නට සිදුවිය. එය දරුණු ත්‍රස්තවාදී සංවිධානයකට දරාගතනොහැකි විය.

සැප්තැම්බර් 11 වැනිදා ත්‍රස්තවාදීන් වොෂින්ටන් නගරයට එල්ල කළ ප්‍රහාරය ත්‍රස්තවාදය කෙරෙහි තිබුණ අනුකම්පාව දුරු කරන එකකි. ඇමරිකාව ඒ වන විටත් එල්.ටී.ටී.ඊ සංවිධානය තහනම් කර තිබුණ අතර මෙම ප්‍රහාරය සමග රටවල් ගණනාවක් එල්.ටී.ටී.ඊ ය තහනම් කරමින් ඔවුන්ට එරෙහිව ක්‍රියා කරන්නට පටන් ගත්තේය. ජාත්‍යන්තර පරිසරයේ සිදුවූ මෙම වෙනස සටන් විරාමයකට යාමට එල්.ටී.ටී.ඊ සංවිධානයට බල කළ එක් තීරණාත්මක සාධකයකි. තම ඊලාම් අදහස වෙනස් නොකරන ලද නමුත් ඔවුන්ට ඒ අවස්ථාවේ වෙනත් විකල්පයක් නොතිබිණ.

එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයට යුද්ධයකින් තොරව පවතින්නට නොහැකිය. ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ජාත්‍යන්තර අත්දැකීම් වුවත් පෙන්වන්නේ ගැටුම් වලින් තොරව ත්‍රස්ත සංවිධානයකට පවතින්නට නොහැකි බවය. සංවිධානයේ සාමාජිකයන්ගේ මානසිකත්වය උසස් මට්ටමක පවත්වාගෙන ආවේ සිංහල ජාතිකයන්ට එරෙහිව වෛරය ඇවිලවීමෙනි. සටන් විරාමයක් පැවති සාමකාමී පරිසරය තුළ, එල්.ටී.ටී.ඊ යට සාමාජිකයන් හා අරමුදල් එකතු කරන්නට ඇති ඉඩ කඩ සීමා වූවා පමණක් නොව යුධ මානසිකත්වය නැති අවස්ථාවක එහි සාමාජිකයන් සිවිල් සමාජයේ ඇති නිදහස් අවස්ථා භුක්ති විඳිමින් සංවිධානය හැර යන්නට ද පටන් ගත්තේය. දෙමල සාමාන්‍ය ජනතාව පවා යුද්ධය හෙයින් බරපතල මානසික පීඩාවක සිටි අතර අවුල්වී ගිය ජන ජීවිතය, සටන් විරාමයෙන් ලැබුණ නිදහස භුක්ති විඳින්නට පටන්ගෙන තිබිණ.

මෙම තත්ත්වය එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදී නායකයන් හා එහි මූලෝපායීය සැලසුම්කරුවන් හොඳහැටි අවබෝධ කරගෙන සිටියහ. සාම සාකච්ඡා වලට පැමිණි නමුත් ඔවුන්ගේ ඒකායන යටි අරමුණ වූයේ ඊලාම් රාජ්‍යයක් බිහිකිරීමයි. සිංහල අන්තවාදය පැතිරවීමෙන් විනා එය ඉටු කරගත නොහැකි බව අවබෝධ කරගෙන සිටි අතර සටන් විරාමය උල්ලංඝනය කරමින් දකුණේ සිංහල මානසිකත්වය යළි සටනට කැඳවීම එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන්ගේ එකම අභිප්‍රාය විය. විශාල වශයෙන් සටන් විරාමය උල්ලංඝනය කරමින් අමානුෂික ලෙස එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් හැසිරෙන නමුත්, රජය එය නොසලකා සාමය ගැන පමණක් කතා කිරීම දකුණේ ජනතාවගේ සිත රිදවන හේතුවක් බව පැහැදිලිව පෙනුනි. සටන් විරාමය හා ආරක්ෂක හමුදා අවමානයට පාත්‍රවන අයුරින් දිගින් දිගටම හැසිරීමෙන් එය කෙරෙහි සිංහල ජනතාව කළකිරවිය හැකි බව එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් දැන සිටියහ. ඒ අනුවම යමින් මෙම සටන් විරාමය ත්‍රස්තවාදීන්ට වාසිදායක ඊනියා සටන් විරාමයක් බව දකුණේ දේශපාලනය චෝදනා කළේය. යුද්ධය නතර වී ජීවිත හා දේපොල ආරක්ෂා කර ගනිමින් ත්‍රස්තවාදීන් කොටු කිරීමේ න්‍යාය, හෙයින් සටන් විරාම ගිවිසුම අවශ්‍ය හා යුක්ති සහගත එකක් බව තේරුම්ගත යුතුය. ත්‍රස්තවාදයට මැඩපවත්වන්නට එකවරම අවුලවන යුද්ධයක් අවසානයේ හමාර වීමෙන් පසු පත්වන අපහසුතා වලට වඩා ප්‍රජාතන්ත්‍රවාදී රජයක් විවිධ ආකාරයෙන් ප්‍රශ්නය විසඳන්නට උත්සාහ කර එය අසාර්ථක වූ අවස්ථාවේ යුදමය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වූ බව දක්වන්නට එය අද කදිම සාක්ෂියකි.

ජාත්‍යන්තර ප්‍රජාවගෙන් තමන් කොන්වෙන බව හා, ඒ නිසාම ඊලාම් රාජ්‍යය අහිමිවන බව අවබෝධ කරගෙන සිටි එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන්, සිංහල ජනතාව ප්‍රකෝප කර යළි යුද්ධය කරා ගමන් කිරීමේ එකම අරමුණ ඇතිව ක්‍රියා කළේය. සටන් විරාමය කඩ කරමින් තැනින් තැන සටන් ඇවිලිණ. සාමසාධක බලකායට කළ හැක්කක් නොවීය. එල්.ටී.ටී.ඊ සංවිධානය සාම සාකච්ඡා මේසයට කැඳවීමේ වගකීම දැරූ නෝර්වේ නියෝජිතයන් නිර්දය විවේචනයට ලක්විය. ගැටුම් වැඩිවන අතර දකුණේ බෙදීම් ද වැඩිවූ අතර ව්‍යවස්ථාව සංශෝධනය කර සාකච්ඡාවෙන් සාමකාමී විසඳුමක් ඇතිකර ගැනීමේ අවස්ථාව ගිලිහී ගියේය. දකුණේ දේශපාලන පක්ෂ අතර ද අර්බුද මතු වූ අතර රාජ්‍ය පාලනයට සම්බන්ධව සිටි පක්ෂ අතර අසමගිය වැඩි වී යළි මැතිවරණයක් කරා රට ගමන්

කළේය. පක්ෂ දෙකක නායකයින් විධායකය හා ව්‍යවස්ථාදායකය නියෝජනය කිරීම නිසා යහපතක් සිදුවනු ඇතැයි අපේක්ෂා කළ නමුත් අවසානයේ අන්‍යෝන්‍ය අවබෝධයකින් තොරව පක්ෂ අතර කඹ ඇදීම නැති ප්‍රශ්න ඇති කළේය. සාමය ඇති කර එහි ගෞරවය තනිව දිනා ගැනීම ගැන නොපෙනෙන සටනක් ඇති බව පෙණුනි. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර හොඳ සම්බන්ධතාවයක් නොවීය. රටේ සංවර්ධනය, රට ගමන් කළ යුතු මග ගැන වෙනුවට දේශපාලන වේදිකාවේ දී මතු වූයේ එකිනෙක පක්ෂ අතර මතබේධ හා දොස් පවරා ගැනීම්ය. මේ හෙයින් දකුණ තව තවත් බෙදීම් ගහන ආවේගශීලී හා සාමය වෙනුවට යුධමය විසඳුමකට අවතීර්ණ විය යුතුය යන අදහස ඉහල යන බව දැකගත හැකි විය.

එල්.ටී.ටී.ඊ යට අවශ්‍ය වූයේ  සිංහල අන්තවාදයක් නියෝජනය කරන නායකත්වයක් බිහිකිරීම තුළින් යළි ගැටුම් අවුලවා ජගත් ප්‍රජාවට හා දෙමල සමාජයට යම් පණිවුඩයක් නිකුත් කිරීමය. මහින්ද රාජපක්ෂ මහතාට සිංහල ජාතිවාදී නායකයෙකු ලෙස පෙන්වා දෙමල ජනතාවගේ ඡන්දය වලකන්නේ එම අරමුණ යටි හිතේ ඇති කරගෙනය. රනිල් වික්‍රමසිංහ මහතා පරාජය කිරීමෙන් අන්තවාදයටත් එයින් පසු අවසාන ඊලාම් යුද්ධයටත් මග පාදා ගැනීම එල්.ටී.ටී.ඊ යේ යටි අරමුණ විය.

එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් විසින් ඉන්දියාවේ අගමැති රජීව් ගාන්ධි මහතා ඝාතනය කිරීමෙන් යම් වරදක් කර ගත්තා ද, මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති කිරීමෙන් ඒ හා සමාන ඉරණමකට, ගොදුරු වූ බව යථාර්ථයයි. එය වූකලී එල්.ටී.ටී.ඊ සංවිධානය තමන් කෙරෙහි අධි තක්සේරුවක සිටිමින් ලාංකික සමාජය හා ජාත්‍යන්තර සමාජය සමග දරුණු කේවෙල් කිරීමකට යාමෙන් අත්කරගත් හානියයි. සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින් ජාත්‍යන්තරයට තමන් ත්‍රස්තවාදී සංවිධානයක් බව එළිපිටම නිරාවරණය වීම ද වරද්දාගත් තැනකි. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා අලුත් වටයකින් සාකච්ඡා ඇරඹීය. එනමුත් අත්වූයේ පැරණි ප්‍රතිපලයමය. මහින්ද රාජපක්ෂ මහතා සිංහල ජනතාවගේ උණුසුම් ප්‍රසාදයක් දිනාගෙනසිටි අතර ඔහු මෙවර එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය හමුවේ තීරණාත්මක මෙහෙවරක නිරතවනු ඇති බවට මහජනතාව විශ්වාස කළේය. සාකච්ඡා අසාර්ථක වූ අතර අන්තවාදය පතුරවා යළි සටන් ඇවිලවීමෙන් පහසුවෙන් රටදෙකඩ කරන මගට අවතීර්ණවීම එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන්ගේ අභිලාශය විය. මේ වනවිට ත්‍රස්තවාදී ක්‍රියා හෙයින් ඉමහත් පීඩාවකට ලක්වසිටි ලාංකික ජනතාව විකල්පයක් නැති පරිත්‍යාගයක් වශයෙන් යුද්ධයට මුහුණදීමට එකසිත් ඇතිව සිටියහ. දකුණේ එකමුතුබවක් ඇති නොවෙන බවට නිතර සිතන නමුත් මේ අවස්ථාවේ දී එය අසත්‍යයක් බව පෙණුනි. හැමවිටම බැටකා සිටි දකුණේ මහජනතාව මේ අවස්ථාවේ දී යම් පාඩමක් ඉගෙනගෙන සිටියේය. බේධ අවම වී ත්‍රස්තවාදයෙන් රට නිදහස් කර ගැනීම සඳහා සියලු බලවේග එකතු විය.  එල්.ටී.ටී.ඊ සංවිධානයෙන් වෙන්වීසිටි කොටස්, නැගෙනහිර මුස්ලිම් සංවිධාන හා දකුණේ දේශපාලන පක්ෂ හා පාර්ලිමේන්තු නියෝජිතයන්ද එක අරමුණක් ඇතිව සම්බන්ධ වූහ. ආරක්ෂක අංශ ඇතුලුව සමාජයේ සෑහෙන කොටසක් ස්වකීය ජීවිත පරිත්‍යාග කළහ. ධනය, දේපොල අහිමි කරගත්තේය. ත්‍රස්තවාදය තුරන් කිරීමේ අවසන් සටන දක්වා යුද්ධය ගෙන යන්නට සමාජය තුළ මහත් උද්වේගයක් ඇවිලිණ. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා දේශපාලන නායකත්වය හා ආත්ම ශක්තිය ඇතිව ඉදිරියට ගමන් කරනවිට ආරක්ෂක යාන්ත්‍රණය හා දේශපාලන සහායට එතුමාගේ සහෝදරයන් උර න්නේය. ආරක්ෂක අංශ හා හමුදාව සිය වගකීම හා යුතුකම ඉටු කරන්නට අප්‍රතිහත ධෛර්යයෙන් ක්‍රියා කළහ. රජය හා විපක්ෂය නියෝජනය කළ දේශපාලන පක්ෂවල මහජන නියෝජිතයන් ද ආණ්ඩුව සමග එක්ව දකුණ එකමුතුකර එක්සත්ව එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදයට එරෙහිව ගෙන යන සටනට සහයෝගය දැක්වීය.

ජාත්‍යන්තර සමාජය යම් බලපෑමක් කළ නමුත් සැප්තැම්බර 11 පාඩම මතක තිබුණ නිසා ත්‍රස්තවාදය පරාජය කිරීම ගැන ජාත්‍යන්තර ප්‍රජාව එරෙහි වූයේ නැත. දෙමල සාමාන්‍ය ජනතාව ආරක්ෂා කර ගනිමින් ත්‍රස්තවාදීන්ට එරෙහිව ගෙන යන මානුෂික යුද්ධයක් ය යන අදහස මතු කරන්නට සමත්විය. විශ්මිතව බලා සිටියදී යුද්ධය අවසන් වූ අතර තමන් සම්බන්ධයෙන් අසීමිත අවතක්සේරුවක සිටි එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදීන් සහමුලින්ම විනාශ කරන්නට ආරක්ෂක අංශ වලට හැකියාව ලැබුණි.

වර්තමාන සමාජය පසුගිය දශක තුන තුළ සිදුවූ අමිහිරි සිදුවීම් දෙස ආපසු හැරී බලමින් පාඩමක් වශයෙන් ඉගෙන ගන්නට උත්සාහ කරමින් සිටී. ත්‍රස්තවාදය අවසන් වූ නමුත් ත්‍රස්තවාදයේ උල්පත විනාශ වී නැත. එපමණක් නොවේ සාර්ථක අසාර්ථක භාවය හෝ වැරදි කවුද නිවැරදි කවුද

යනුවෙන් චෝදනා කරමින් යළි මත බේධ අවුලවන්නට ද මෙය අවස්ථාව නොවේ. යුද්ධය හමුවේ යම් ඒකාග්‍රතාවයක් තිබුණ නමුත්, රජය හා විපක්ෂය නියෝජනය කළ කොටස් අපේ පැරණි සංස්කෘතියෙන් සම්පූර්ණයෙන් ම මිදී නැත. ග්‍රින් අවශ්‍යව ඇත්තේ රටක් වශයෙන් සමස්ථ ජනතාව එකමුතු කිරීමයි. රටක් තුළ ඇතිවන යුද්ධයක ජයග්‍රාහකයන් පරාජිතයන් නැත. මේ ජයගෙන ඇත්තේ රට තුළ වෙසෙන අප හා රටේ විසූ ත්‍රස්තවාදී කණ්ඩායම අතර යුද්ධයකි. මෙය සිංහල ජනතාව හා දෙමල ජනතාව අතර තිබුණ යුද්ධයක් නොවේ. මේ නිසා යුධමය කාල පරිච්ඡේදයට වඩා සාමය ස්ථාපිත කිරීමේ වගකීම බැරෑරුම්ය. ජාතීන් අතර යළි විශ්වාසය දිනා ගැනීම අසීරු කරුණකි. බිඳුණු හදවත් යළි එකතුකර ගත යුතුය. වෙනස්කමක් නැති එක රටක් තුළ සාමකාමීව, සමාන අවස්ථා ඇතිව, සියලු දෙනාටම ජීවත්විය හැකි බව තහවුරු කිරීම අවශ්‍යය. අවශ්‍ය නම් සෑම ජන කොටසකටම සමාන අවස්ථා ඇති, සමාජය ගරු කරන අලුත් ව්‍යවස්ථාවක් කරා ගමන් කර යුක්තිය හා සාධාරණත්වය සමාජය තුළ පතුරවාලිය යුතුය. ආකල්ප වෙනසක් තුළින් පොදු අනන්‍යතාවයක් ඇතිකළ යුතුය. සිංහල හා දෙමල ජන කොටස් අතර ප්‍රශ්න තිබෙන බව අවුරුදු දහස් ගණනක් තිස්සේ කියාදෙන එකම කතාන්දරයයි. මේවා ගැන දියුණු සමාජයේ විද්වතුන් ප්‍රශ්න කළ යුතුය. පැරණි සමාජයේ ඇති මත හා ආකල්ප ඒ ලෙසම ඉදිරියට ගෙන යමින් යළි අන්තවාද දේශපාලනය වැදගත්වන්නේ මෙම ජාතීන් අතර අන්‍යෝන්‍ය අවබෝධය හා එක රටක් ශ්‍රී ලාංකිකක අනන්‍යතාවයක් යන සංකල්ප සමාජය තුළ තහවුරු කිරීමටය. එය තහවුරු වන්නේ හුදෙක් දේශපාලන ප්‍රකාශන වලින් නොව ක්‍රියාවෙන්ය.

රාජ්‍යයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සැක හා විවේචන ඇතිවන හැම අවස්ථාවකම දිය හිඟවී අතට අල්ලා ගත් මත්ස්‍යයාට පණ ගැහෙන්නට අවශ්‍ය තරම් ජලය නමැති මහජනතාව එකතුවන බව අමතක කළ යුතු නැති සාධාරණ පැත්තයි. මේ නිසා අප හැම දෙනා සතුවම බරපතල වගකීමක් තිබේ. ත්‍රස්තවාදය අවසන් හෝ භීෂණය තුරන් කළා ය යන හැඟීම ඇතිව යළි සුපුරුදු දේශපාලන ගමන නැවතත් ආරම්භ කළහොත් සිදුවන්නේ සමාජයේ නොදන්නා තැනකින් යළි පුපුරායන මොහොත උදා වීම පමණකි.

එකම රටක් ඇතුලත සිදුවූ මෙවැනි යුද්ධමය තත්ත්ව ලෝකයේ තැනින් තැන ඇතිවී තිබේ. එපමණක් නොව රටවල් අතර යුධ ගැටුම් ගණනාවක් ඇතිව ඇත. මෑත කාලය තුළ ඉරාකය හා ඇෆ්ගනිස්ථානය වැනි රටවල් මුහුණ දුන්නේ ඉතාමත් දියුණු යුධ උපකරණ හා තාක්ෂණය භාවිතයෙන් කළ දැවැන්ත යුද්ධයකටය. මුලු ලෝකයේ සියලුම රටවල් ආරක්ෂාවට වෙන් කරන මුදලට වඩා වැඩි මුදලක් ඇමරිකාව ස්වකීය ආරක්ෂක වියදම් වශයෙන් වසරකට වැය කරයි. නමුත් වැරදීමක් නැතිව සර්ව යුක්ති සහගත තීන්දු ගන්නට ඇමරිකාවටත් නොහැකි වී ඇති බව අනාවරණය වෙයි. යුද්ධයක දී වෙනත් රටවල් ගන්නා ලද තීන්දු හා එහි හානිය ගැන දොස් පවරමින් චෝදනා එල්ල කරමින් තවත් කෙනෙකුට වරද පටවා එයින් අවමානයට පත්කරමින් ජීවත්වන යුගයක් රටට අවශ්‍ය නැත. දැන් අවශ්‍ය අනාගතය දෙස බැලීමයි. දේශය එකතු කරන්නා සේ ම ජාත්‍යන්තරය සමග ද අලුත් ආකාරයකට එකතුවීමයි. ජූලි කලබල හෙයින් රට හැර ගිය ලාංකික විහාල පිරිසක් බටහිර සමාජයේ වෙසෙති. ඉන්දියාවේ ජීවත් වන පිරිස ද සුලු පටු නොවේ. මේ පිරිස සමග ජාත්‍යන්තර සමාජය දිනාගන්නා වැඩ පිලිවෙලක් අපට අවශ්‍යය. යුද්ධයක දී රටවල් සමග ඇතිවන මත ගැටුම් හා අමනාපකම් දැන් අමතක කිරීම වටී. එක් එක් රටවල අනන්‍යතාව, ඔවුන්ගේ ආකල්ප තේරුම්ගෙන එකිනෙක රටවල් සමග බැඳීම් ඇති කරගැනීමට මෙය සුදුසුම වකවානුවයි. ඉන්දියාව සමග රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා දුර්වල වීමෙන් එල්.ටී.ටී.ඊ ය එහි වාසිය අත්පත් කර ගත් බව රහසක් නොවේ. එය අත් ග්‍රිකීමකි. සෙසු රටවලින් ද එවැනි දේ වාර්තා වන්නට ඉඩදිය යුතු නැත. මේ ගැන පුලුල්ව සිතන්නට අපට හැකිවිය යුතුය.

අවංකව අවධානය යොමු කළහොත් දෙමළ සමාජය වෙනුවෙන් සැබෑ බුද්ධිමත්, ප්‍රශ්නයක් දෙස සමබරව බලන්නට හැකි මහජන නියෝජිතයන් නැත. හෙට දිනය ගැන සිතා එකතු වී වැඩ කරන්නට හැකි එවැනි ගැඹුරු වියතුන් රැසක් රටින් ඉවත්ව ගොස් වෙනත් රටවල වෙසේ. තවත් පිරිසක් පවතින දේශපාලනයට අවතීර්ණ වීමට අකමැතිය. සිංහල සමාජය තුළ ද එවැනි හිඩැසක් විවර වී ඇති බව මගේ අවංක විශ්වාසයයි. මේ පරතරය වැඩි වන තාක් විවෘත මනසකින් වඩා ප්‍රජාතන්ත්‍රවාදී හා ලාංකික ඇසකින් මහජන ප්‍රශ්න දෙස බලන්නට අපට ඇති හැකියාව අඩුය. එය තේරුම් ගත යුතුය. අන්ධකාර යුද්ධයක පැටලී සිට එයින් ජය අත් කරගෙන ආලෝකවත් උදෑසනක

කාන්තියෙන් අන්ධවී නිසි තැන නියමාකාරයෙන් සමබර තීන්දු ගන්නට අපොහොසත් වුවහොත් මේ ලබාගත් ත්‍රස්තවාදය පරාජයට පත්කිරීමේ වාසිය නොදැනුවත්වම අවාසියක් බවට පත්විය හැකිය. සමාජ සංවාදයක් අවශ්‍යය. එයට සමාජ නායකයින් ජනමත ප්‍රධානීන් සම්බන්ධ විය යුතුය. එනමුත් මේ සංවාදයෙන් රටට කරන්නේ හානියක් ද තමන් කරන්නේ තමන්ගේම රටේ කොටසකට සාප කිරීමක් ද යන්න අවබෝධකර ගැනීමත් අවශ්‍යම කරුණකි. යුධමය පරිසරයක් තුළ සතුරන්, කුමන්ත්‍රණ, යටි උගුල්, අවිශ්වාසය හා සැකය වැනි ආකල්ප බහුලව තිබිය හැකි නමුත් සාමකාමී සමාජයක එවැනි අවතාර තවදුරටත් තිබිය නොහැකිය. තිබිය හැක්කේ විවෘත බව හා සාමකාමී අවස්ථා පමණකි. දැන් උදා වී ඇත්තේ රට සංවර්ධනය කිරීමට හා බෙදුනු රට එකතු කළ යුතු යුගයකි.

සංවර්ධනයේ ප්‍රතිඵල බේදයකින් තොරව සියලුම දෙනාට හිමිවන බවට විශ්වාසයක් සමාජයේ තහවුරු වීම අවශ්‍යය. බේද හා ගෝත්‍ර නැති සාධාරණත්වය ඇති ක්‍රමයක් බිහි කරන බව පෙනෙන්නට තිබිය යුතුය. බලය විමධ්‍යගත කිරීම ගැන මේ දිනවල විවාදයකි. එහෙත් එය සිදුවන්නේ සාධාරණ ක්‍රමයක් ඇති කිරීමේ සම්පූර්ණ ක්‍රියාදාමයේ කොටසක් වශයෙන් බව ජනතාවට තේරුම් ගත හැකි වීම වැදගත්ය.